**ශීර්ෂය 10 - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 10 - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 10 දින කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

කොමිෂන් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 291.95 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 256.33 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 35.62 ක් හෙවත් සියයට 12.20 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 245.50 | 225.16 | 20.34 | 8.28 |
| මූලධන | 46.45 | 31.17 | 15.28 | 32.89 |
| **එකතුව** | **291.95** | **256.33** | **35.62** | **12.20** |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාල විෂය අංක 01001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.69 | 4.67 | 3.69 | 5.08 | 20.00 | 14.66 |

**2.2.2 අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාළ විෂය අංක 01002 දරන අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 250.00 | 7.06 | 2.50 | 3.44 | 275.00 | 19.34 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

කොමිෂන් සභාවට අදාළ පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.148,324 ක් විය.

2.4 **විගණන නිරීක්ෂණය**

-----------------------

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------------

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

----------------------------------------------

කොමිෂන් සභාවේ කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 1647 (ඇ) ප්‍රකාරව ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොතක් පවත්වා නොතිබුණි.

**3.2 විගණන විමසුම්වලට පිළිතුරුදීම**

-------------------------------------

කොමිෂන් සභාව වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුමකට 2016 ජුනි 10 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 19.34 ක් වී තිබුණි.

**3.3 අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුම**

------------------------------------

සමාලෝචිත වර්ෂයේදි කොමිෂන් සභාව විසින් විෂය අංක 01002 දරන අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුමක කටයුතු ඉටු කර තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ එම ගිණුම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුමේ නඩු භාණ්ඩ නිලධාරියාගේ මුදල් ශේෂය රු. මිලියන 19.12 ක් විය. එයින් රු.මිලියන 5.28 කට අදාළ නඩු 147 ක් වර්ෂ 5 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයකට අයත් වන අතර එම නඩුවලින් 19 ක් පමණක් අවසන් කර තිබුණු බවට පිළිතුරු ලබාදී තිබුණත්, එම නඩුවලට අදාල නඩු භාණ්ඩ මුදල් ශේෂය නිරවුල් කළ බවට තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

--------------------------------------

**3.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**3.4.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර නොතිබුණි.

**3.4.3 විගණන හා කළමනාකරණ කමිටුව**

විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**3.4.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල වාර්තාව 2016 ජුනි 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**කොමිෂන් සභාවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.**

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

එකතුව රු.මිලියන 3.68 ක් වටිනා මෝටර් වාහන 03 ක් හා වටිනාකම තක්සේරු කර නොතිබුණු මෝටර් රථයක් නිෂ්ක්‍රීයව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් එම වාර්තා 2016 ජුනි 10 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**3.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) **මුදල් රෙගුලාසි 104 (1)** | - | 2015 වර්ෂයේදී අවස්ථා 2 කදී කොමිෂන් සභාව සතු වාහන අනතුරුවලට ලක්වී තිබුණත් ,ඒ පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 (ආ) සහ 1646 | 84,042,648 | සංචිත වාහන 25 කට අදාළව 2015 ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | - | සෑම මාස 06 කට වරක් කොමිෂන් සභාව සතු වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |

## 3.7 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

කොමිෂන් සභාව විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) 2015 වර්ෂයට පෙර ලද විමර්ශනය නොකර ඉදිරියට ගෙන එන ලද පැමිණිලි සංඛ්‍යාව 9752 ක් වූ අතර 2015 වර්ෂයේදී පැමිණිලි 3913 ක් ලැබී තිබුණි. මෙම පැමිණිලි 13665 කින් පැමිණිලි 3021 ක් පමණක් 2015 වර්ෂයේදී විමර්ශනය කර තිබුණි.

(ii) 2015 වර්ෂයේදී පළාත් මට්ටමින් අවම වශයෙන් පළාත් 03 ක් තුළ නිවාරණ වැඩසටහන් 3 ක් සංවිධානය කිරීම සැලැසුම් කර තිබුණත්, එය ඉටු කර නොතිබුණි .

(iii) නඩු පැවරීම හා නඩු මෙහෙයවීම මෙම ආයතනයේ තවත් ප්‍රධාන කාර්යයක් වූ අතර වර්ෂය තුළ විමර්ශනය කරන ලද පැමිණිලි 3021 කින් වර්ෂය තුළ ගොනු 108 ක් සඳහා පමණක් නඩු පවරා තිබුණි.

**3.8 අවිධිමත් ගනුදෙනු**

-----------------------

කොමිෂන් සභාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

-------------------------------------------------------------------

නිල නිවාසය අළුත්වැඩියාව සඳහා ආයතනය විසින් මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කළ යුතු වුවත්, එම කාර්යය සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි.

**(ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

---------------------------------------

විධිමත් අනුමැතියකින් තොරව කොමිෂන් සභාවේ ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂය යටතේ රු.508,834 ක් වැයකර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් නිල නිවසක් අළුත්වැඩියා කර තිබුණි.

**3.9 පාඩු හා හානි**

---------------

විසර්ජන ගිණුමේ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ තව දුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට තිබුණු රු.217,560 ක් වූ පාඩු 11 ක් නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම පාඩු අයකර ගැනීමට නොහැකිව පැවතුණි. එයින් රු.61,005 ක් වටිනා සිද්ධි 2 ක් වසර 10 කට වඩා පැරණි ඒවා විය.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 62 | 24 | 38 | - |
| (ii) | තෘතියික මට්ටම | 22 | 14 | 08 | - |
| (iii) | ද්විතියික මට්ටම | 590 | 249 | 341 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 128 | 59 | 69 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 03 | - | 03 |
| | එකතුව | 802 | 349 | 456 | 03 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් පුරපාඩු 456 ක් පැවැතුණි. කොමිෂන් සභාව විසින් එම පුරප්පාඩු විධිමත් පරිදි පිරවීමට කටයුතු කර නොතිබුණි. අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවූ අනියම් සේවකයින් තිදෙනෙකු බඳවා ගෙන තිබුණි.